ඇමුණුම I

# විකිරණශිල්පී පුහුණු පාසල් සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණශිල්පී තනතුරට බඳවා ගැනීම සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය

## 01. සේවා පළපුරුද්ද

ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව මූලික සුදුසුකමට අවශ්‍ය අවම සේවා කාලයට අමතර සේවා කාලයක් සඳහා වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට ඊට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීම ද සිදුකළ යුතුය.

**- උපරිම ලකුණු 60 -**

## 02. අතිරේක අධ්‍යාපන සුදුසුකම්

2.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන

i. තනතුරට අදාල ක්ෂේත්‍රයේ දර්ශනපති/ දර්ශනශූරී උපාධිය සඳහා (Master of Philosophy/ Doctor of Philosophy) - ලකුණු 30

ii. තනතුරට අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 25

iii. කළමණාකරන පශ්චාත් උපාධිය හෝ තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 15

2.2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාදෙන

i. තනතුරට අදාල ක්ෂේත්‍රයේ උපාධිය සඳහා - ලකුණු 15

ii. කළමණාකරන උපාධිය සඳහා හෝ තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා - ලකුණු 10

2.3 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් ලබාගත් පාඨමාලා කාලය මාස 06කට හෝ පැය 72 කට නොඅඩු පාඨමාලාව (අධ්‍යාපන හා වෙනත් මූලික සුදුසුකම් යටතේ සලකා බලන ලද පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

i. තනතුරට අදාල ක්ෂේත්‍රයේ වෙනත් ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 7.5

ii. කළමණාකරන/ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 2.5

**- උපරිම ලකුණු 30 –**

සටහන -
- ඉහත අංක 02 යටතේ ලබාගෙන ඇති ඉහළම සුදුසුකම සඳහා **පමණක්** ලකුණු ලබාදෙනු ලැබේ.

## 03. විශේෂ කුසලතාවයන්

අදාල වෘත්තීය ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රකාශයට පත්කර ඇති විද්‍යාත්මක පර්යේෂණ ප්‍රකාශන, පොත්පත්, පුවත්පත් වල ප්‍රකාශිත ලිපි, උපදෙස් හා මග පෙන්වීම්, ජර්නල් පත්‍රිකා, සමුළු පත්‍රිකා, උද්ධෘත යනාදිය ඇගයීම් කිරීමේදී ඇමුණුම II හි නිර්ණායක වලට අනුකූලව ලකුණු ලබාදිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී ඇගයීම් කරන ලද ආකාරය සම්මුඛ පරීක්ෂණ ලේඛනයේ පැහැදිලිව සඳහන්ව තිබිය යුතුය.

**- උපරිම ලකුණු 10 –**